


# "මුතුහර", "හෙළ මාත්‍රා" සහ "ලිට්ල් ස්ටේජ් 2014"

"වියළුන බිමකි. දැඩි නියඟයකි. පාළු අහස් තලයකි. වියළි සුළං මහා එයි. කෙමෙන් කෙමෙන් අහස් ගැබ වළාවන්ගෙන් පිරී යයි. අකුණු ගසයි. ගොරවයි. මහ වැසි වසියි. පොකුණු වැව් පිරෙයි. මහනෙල්, ඕලු ආදී මල් පිපෙයි."

"වාක්‍ය රචනාවක් වගේ..." පින්සල පන්හිඳගෙ ලියමනය එබිකම් කළා.

"එව් මේ පුංචි ඈයො ලියන තාලෙ වාක්‍ය ටිකක්. හැබැයි පුංචියට ලිව්වට ඒවා එකතු වුණාම ලොකු තේරුමක් ලැබෙයි." පන්හිඳ ලියමනෙන් ඔළුව උස්සන්නේ නැතිවමයි පින්සලට උත්තර බැන්දෙ. පහුගිය මාස කීපයේ පන්ටයි-පින්ටයි පුංචි අයගේ හපන්කම් දකින්න අවස්ථාවල් කීපයක් ම ලැබුණා. පන් ඒ ගැන යමක් ලියන්නයි මේ අර ඇන්දෙ.

මීට දශක තුන හතරකට පෙර මෙරටට සංක්‍රමණය වූ ශ්‍රී ලාංකිකක සම්භවයක් ඇතියවුනට අපගේ සංස්කෘතිකාංග විඳීමට ලැබුණේ ඉතාම අඩු වශයෙන්. සැබැවින් ම ඒ අතින් එදා මේ බිම වියැළුණ බිමක් සේ ම විය. බටහිර සංස්කෘතියට අවනත වූ පරිසරයක පෙරදිග දේ ඇසුරු කිරීමට නො ලැබුණා වූ නියං සමයකි ඒ.



මෙරට අවශ්‍යතා අනුව නොයෙක් ප්‍රවණතාවයන් ඇතිවිණ. කෙමෙන් පෙර දිග දේ අපර දිග පරි සරයකට සංක්‍රමණය වූයේ පාළු අහස් ගැබ වළාවන්ගෙන් පිරී යන සේය. මෙහි පදිංචි වූ සංක්‍රමණකියන් ස්ථාපිත වූයේ වැසි වළා පෙළ ගැසෙන්නාක් මෙනි. අදහස්, මතවාද ගැටිණ. ගිගුරුම් ඇතිවිණ. අකුණු නැංවිණ. අවසන මහ වැසි වසින්නට විය. ඒඅ පගේ රටින් වළා පෙළක සැඟව ආ කුසලතාවයන්ගෙන් වට වැඩියි.

මෙරට වියැලි පරිසරයේ සිඳී ගිය පොකුණු ඒ දියෙන් පිරෙයි. තැන තැන රැඳුන අපගේ සමාජ උප කුලකයට අයත් අධ්‍යාපන ආයතන, පුණ්‍යායතන, සමාජ සංවිධාන මේ පොකුණු සේ නොවේද? අළුතින් ම පොකුණු ඇතිවෙයි. පොකුණු මතු නොව වැව් ද ඉදිවෙයි. ඒ වැව් පොකුණු වලින් පිපෙනා සුවඳවත් මල් වැනිය කුසලතාවයන්ගෙන් සපිරි අපගේ දූදරුවන්. ඔවුහු දසත අපේ සුවඳ විහිදුවති. මේ වර්ෂා කාලයයි. අප මේ විඳින්නේ ඒ වැසිවල සිහිලයි. අප මේ දකින්නේ ඒ සුපිපෙන පුෂ්පයි.

පසුගිය දෙමස ඇතුලත අප දුටු අපේම හපන්කම් තුන් කොටසකට ගොනු කළ හැකියි. කුඩා දරුවන්ගේ හපන්කම්, යෞවන යෞවනියන්ගේ හපන්කම් සහ වැඩිහිටියන්ගේ හපන්කම් ය ඒ. වැඩිහිටි පිරිසකගේ ගායනාවන් විඳීමට කෝකිල නාදේ "සුනිල් ගී ප්‍රසංගයෙන් අපට හැකිවිය. තරුපති මුණසිංහයන්ගේ සංගීත මෙහෙයවීමෙන් "ගායනා" කණ්ඩායමට සුනිල් සාන්තයන්ගේ ගීත සාමූහිකව ගැයූහ. තරුණ කණ්ඩායම් කීපයක රංගන හැකියාවන් හා නිර්මාණාත්මක හැකියාවන් "ස්කැට්ස්" කෙටි නාට්‍ය උළලේදී දුටුවෙමු. වැඩිපුරම වුයේ කුඩා දරුවන්ගේ විවිධ ප්‍රසංගයි.

වර්ෂ 1998 පෙබරවාරි 1 දා සිසුන් 19කින් හා ගුරුවරුන් 14 දෙනෙකුගෙන් ඇරඹුණ සෙන්ට් ඕල්බන්ස් සිංහල භාෂා පාසැලේ වාර්ෂික විවිධ ප්‍රසංගය "ලිට්ල් ස්ටේජ් 2014" නමින් වේදිකා ගත විය. පොල් තෙල් පහන දල්වා, පන්සිල් සමාදන්ව ඇරඹූ උත්සව සභාව එහි සභාපතිවරයා වන හැපි පෙරේරා මහත්මා විසින් අමතන ලදී.

"භරත ආශ්‍රම්" සිසුන් විසින් මුලදී ම ඉදිරිපත් කළ නර්තන "පායන කාලෙදී", "සීගිරි පර්වත ප්‍රාන්තියේ", හතර ශ්‍රේණියේ දරුවන්ගේ නර්තනය, "රෑ රසේ අඳිනා ලෙසේ", "සඳ කොමලී", "හින්චි පින්චි හාවා", "රජ්ජුරුවෝ උඩයි උඩයි", " ජලධාරාවෝ", "කං කං බූරු", "සුදු සඳ එළියේ", " මුව මද හාසේ", "රන් දහදිය බින්දු බින්දු", "දඟකාරයි හැඩකාරයි", " උඩරට කඳුකර" සහ "මල් වියනෙන් බැඳි" වැනි විවිධ නර්තන අංග රැසක්ම පෙළ ගන්වා තිබිණ. සැබැවින් දරුවන්ගේ නර්තන හැකියාවන් මෙන් ම ඒ සඳහා වන උනන්දුව වෙසෙසින් කැපී පෙණින. ඒ සඳහා ඇඳුම්, පැළැඳුම් සකස් කිරීමේදී ද අංග සඳහා ගැලපෙන විලාශයට ඒවා සකස් කරගෙන තිබිණි. විශේෂයෙන් ම භරත නර්තන අංග, "හින්චි පිංචි හාවා", මයුරා වන්නම, "සුදු සඳ එළියේ ", "මුව මද හාසේ", "උඩරට කඳුකර" වැනි අංග සඳහා කළ ඇඳුම් නිර්මාණ කැපී පෙණින. මේ සියළු අංග ඒ ඒ දරුවන්ගේ වයසට ගැලපෙන ඒවා විය. කෙත්මි ජයවීර දැරිය "දිය බෙරළිය මල් නෙළන්න" ගීය හැඟීම් බරව සිය දක්ෂතාව පෙන්වමින් අපූරුවට ගැයුවා ය. හතරවන ශ්‍රේණියේ දරුවන් ගැයූ "පොළොවෙන් මතුවෙන" තුන්වන ශ්‍රේණියේ දරුවන් ගැයූ "සිරි සෙත් සාදයි" සහ "මුනි සිරිපා" ගී වලට අමතරව නවීන් ජයකොඩි, නිරුක්ෂි කුලරත්න, අයේෂා ජයකොඩිල බවනි ගුණවර්ධන දරු දැරියන් ගැයූ ගී ද සිත්ගන්නා සුළු විය.

රඟපෑම් අතර තුන වසරේ සිසුවකු ඉදිරිපත් කළ අභි රූපන රංගනය වඩාත් සිත් ගත්තේය. එම පන්තියෙන් හා හතරවන ශ්‍රේණියෙන් ඉදිරිපත් කළ විකට ජවනිකා දෙකක් ද වූ අතර, "පොල්ලේ බලේ" "එළුවන් කෑම", "අඹ යහළුවෝ", "සේරි වාණිජ" යන කෙටි නාට්‍ය කීපය ද ඉදිරිපත් විණ. රඟපෑම් තුළින් ද අපගේ දරු දැරියන්ගේ හපන්කම් දැකගැනීමට ලැබීම මහත් වූ සතුටකි.

හෙළ සංස්කෘතියේ අභිමානය අපගේ දරුවනට අත්විඳීමට සළස්වනු වස් සංවිධානය වූ හෙළ මාත්‍රා දොර වැඩුම ද සමන් පනාපිටිය සහ සමන් ලෙනින් යන ජන කලාකරුවන් දෙපළගේ සහභාගීත්වයෙන් පසුගියදා පැවැත්විණ. දරු දැරි යන් විසි දෙනෙකුගෙන් පමණ සැදුම් ලත් "හෙළ මාත්‍රා" සංවිධානය කරන්නේ මධූ නානායක්කාර මහත්මිය ප්‍රධාන පිරිසයි. එකම සෙවනක් යට, එකම කාලයක් තුළ විවිධ සංස්කෘතික අංග පිළිබඳව කුඩා දරුවන්ට අවබෝධය ලබා දීම මෙහි අරමුණයි.

චිරාත්ගත සම්ප්‍රදායානුකූලව පහන දැල්වීමෙන් අනතුරුව පූජා නැටුමක් කුඩා දැරියන් විසින් ඉදිරිපත් කරන ලදී. "හෙළ මාත්‍රා" තේමා ගීතය ගැයුමෙන් අනතුරුව මව් බිමින් ආ කලාකරුවන්ගේ ඉදිරිපත් කිරීම් පෙළගැනුවුණ අතර, ඊළඟ ළමා අංගය වූයේ ඔන්චිලි වාරම් ඇසුරින් ඉදිරිපත් වූ කෙළි ගී අංගයයි. ප්‍රශස්ති ගීයකට නැටීම ඉන් අනතුරුව වේදිකාගත වූ ළමා අංගය වූ අතර, " නරිබෑනා" නාට්‍යයේ කෙටි නිර්මාණයක් ප්‍රශංසාත්මක ලෙස ඉදිරිපත් විණි. එහි "නරිබෑනා" චරිතය රඟ පෑ කුඩා දරුවාගේ රඟපෑම කැපී පෙණින.

උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අනුව නිර්මාණය වූ නර්තනාංග දරුවන්ගේ හපන්කම් පෙන්වීමට ලැබුණු අවස්ථාවන් වීය. උපාලි පෙරේරා මහත්මාගේ නායකත්වයෙන් දරුදැරියන් සජීවීව වාදනය කිරීම විශේෂයෙන් විය. ආසියානු වෙසක් උත්සවය සඳහා මෙල්බන් නගරයේ පෙරහැරේ ගමන් ගත් පෙරදිග තූර්ය වාදක කණ්ඩායමේ ඉදිරිපත් කිරීම සරඹ සන්දර්ශනයක ස්වාභාවය ගත්තේය. වඩාත් ම ආකර්ශනීය අංගය වූයේ උත්සවයේ අග පැවැත්වුණ බෙර සන්ධ්වනයයි. කුසලතා ගණනාවක් එකම දරුවකු තුළ පිහිටීම සඳහා බොහෝ නිදසුන් මෙම ප්‍රසංගයේ දක්නට ලැබීම විශේෂයක් විය.

මෙල්බන්හි නිර්මාණය වූ "අපූරු නුවණ" නම් වූ ළමා නාට්‍යයක් දුටු මව්බිමේ රූපවාහිනී සංස්ථාවේ ළමා වැඩසටහන් ඒකකයේ සහකාර අධ්‍යක්ෂ පත්මසිරි ප්‍රනාන්දු මහත්මා මෙල්බන් දරුවන් වෙනුවෙන් ද මුතුහර කණ්ඩායමක් සංවිධානය කිරීමට ආරාධනා කළේය. ඒ අනුව වත්සලා ඉෂ්ඨවීර මහත්මියගේ මූලිකත්වයෙන් පිහිටවූ මුතුහර මෙල්බන් සමාජයේ අංකය 2514 යි. මේ ජාතික රූපවාහිනියේ දෙවන ජාත්‍යන්තර ළමා සමාජයයි. වර්ෂ 1983 අප්‍රේල් මස 27 දා නිල වශයෙන් මුතුහර ළමා සමාජය බිහි වූ අතර එහි ප්‍රථම නිෂ්පාදිකාව වූයේ ආචාර්ය ලලිතා සිරිබද්දනයි. දරු දැරියන් 40කින් යුත් මෙම සමාජය මෙහිදී දොරට වැඩීම සිදුවූයේත් පසුගිය මාසයේයි.

ආගමික වතාවත් කොට සම්ප්‍රදායානුකූලව පහන දැල්වීමෙන් අනතුරුව පූජ්‍ය පක්ෂයේ දේශනා දෙකක් පැවැත්විණ. පියසිරි ශිල්පාධිපති ශිල්පියාණන්ගේ " පවර උතුම්" ජල ගීයට අනුව පූජා නැටුමක් ඉන්පසුව වේදිකා ගත විය. මව්බිමෙන් ලැබුණා වූ පණිවිඩ විකාශය කිරීමෙන් අනතුරුව මුතුහර තේමා ගීතය දරු දැරියන් ගායනා කළේ කට පාඩමිනි. ඒ මුතුහර මෙල්බන් සමාජයේ නිලධාරී මණ්ඩලය වේදිකාවට කැඳවා හඳුන්වා දෙමින් දොරට වැඩීමෙන් පසුවයි. "අපේ කතාව" නම් වූ විරිඳු ගායනය දරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කළේ රඟපාමිනි. අපගේ යථාර්තය නිර්භයව විරිඳු පෙළකට නංවා තිබුණේ අරලිය මල්ලවරච්චි මහත්මියයි. විවේකයට පෙර " ගමේ සුවඳ" නර්තන අංගය වේදිකාගත වියග වීවේකයෙන් පසුව මුතුහර මෙල්බන් සමාජයේ තේමා ගීය සියළු සාමාජික සාමාජිකාවන් එක්ව ගයන ලදී. මෙල්බන් දරුවනට මුතුහර ලැබීමට හේතු වූ "අපූරු නුවණ" නම් වූ මහදැනමුත්තාගේ සහ ගෝලයින්ගේ කතා පුවත අවසන රඟ දැක්විණ. ඊට පෙර ඉදිරිපත් වූයේ "බෙර නද" නම් ළමා බෙර සන්ධ්වනියයි. කුඩා කල සිටම අපගේ වැයුමට හපන්කම් දැක්වූ දරුවන්ගේ හැකියාවන් වර්ධනය වනු දක්නට ලැබීම සතුටට කාරණයකි. වාද්‍ය වෘන්දය හා ගායනා පුහුණු කරන ලද්දේ තිසර බණ්ඩාර යොවුන් සංගීත වාද්‍ය ශිල්පියායි. අවසන ගුරු උපහාර පිදුමකින් උත්සවය සමාප්ත විය. මෙම ගුරුවරුන් ද තරුණ පිරිසක් වීම විශේෂත්වයකි. ඇතැම් තරුණ තරුණියන් මව්බිමේ මුතුහර කණ්ඩායම්වල සාමාජිකයින්ව සිටි අයයි.

මෙම ළමා ප්‍රසංග අතර අප හට දැණුන පොදු කාරණයක් වූයේ චිත්‍ර ශිල්පයට හපන්කම් පෑමට ලබා දී තිබුණු ඉඩකඩ ප්‍රමාණයයි. "මුතුහර" ඇරයුම් පතටත්, සමරුවටත් ළමා චිත්‍ර යොදාගෙන තිබිණ. "මුතුහර" මෙන්ම "හෙළ මාත්‍රා" කණ්ඩායමේත් චිත්‍ර ඉගැන්වීම සිදු කෙරෙයි. එහෙත් වේදිකා සැරසිළි පසුතල යනාදිය සඳහා දරුවන් දායක කරගත හැකි නොවේද? මෙවන් ප්‍රසංග ඇසුරින් ආලෝකකරණය, ශබ්ද පරිපාලනය වැනි ශිල්පීය අංශ සඳහා ද දරුවන්ට පුහුණුවක් ලබාදිය හැකියි. සෙන්ට් ඕල්බන්ස් සිංහල භාෂා පාසැලේ විවිධ ප්‍රසංගය වීඩියෝගත කළේ දරුවෙකි. එය සතුටට කාරණයකි. අද මේ පුහුණුව ඔවුනට ලබා දුනහොත් එය මතු දින සඳහා කරනා සරු ආයෝජනයක් වනු ඇත. ඇතැම් සිංහල භාෂා පාසැල් උත්සවවල මේ දේ කරන්නේ ඒවායේ ආදී ශිෂ්‍යයින් විසිනි. බොහේවිට ඔවුහු වැඩිහිටියනට ද වඩා සැළකිල්ලෙන් නිවැරදිව ඒ දේවල් කරති. මේ උත්සව තුනේ දීම අප දුටු ප්‍රධාන ම දුර්වලකම් වූ ආලෝකකරණය, ශබ්ද පරිපාලනය, සම්බන්ධීකරණය හා වේදිකා පරිපාලනය වැනි දෑ වඩාත් සාර්ථකව කර ගැනීමට මෙකී කාරණා ඉදිරියේදී වැදගත් වනු ඇත. ශාලාවල ඇති අපහසුකම් හා දුර්වලතා ජය ගැනීම අප හට ඇති විශාලම අභියෝගය වී ඇති නිසාය, ඒ.

පන්හිඳ තිතක් තිව්වා...

බලන්නට ඇති පත්තර අතර කියවන්නට ඇති පත්තරයක්

